මගේ අංකය : JSC/SEC/CIR/2025

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් සහ
අධිකරණ නිලධාරීන් වෙත,

<u>2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත ප්‍රකාරව 2025 වර්ෂයට අදාළව තම වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන නිලධාරීන් උදෙසා නීතිය ක්‍රියාත්මක කිරීම</u>

ශීර්ෂගත කරුණ සබැඳිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලද අංක DG/CA/AD/144 සහ 2025.05.16 දිනැති ලිපිය, ඇමුණුම 1 අධිකරණ සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පලකොට අවශ්‍ය කටයුතු සඳහා ඔබගේ අවධානයට ලක්කරමි.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2025 මැයි මස 22 වන දින,
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION
තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.
දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045
වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපැල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk


මගේ අංකය: DG/CA/AD/144
2025.05.16

සභාපති,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

**<u>2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත ප්‍රකාරව 2025 වර්ෂයට අදාළව තම වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන නිලධාරීන් උදෙසා නීතිය ක්‍රියාත්මක කිරීම</u>**

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත ප්‍රකාරව 2025 වර්ෂය සඳහා වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබා දීමේදී මධ්‍යගත ඉලෙක්ට්‍රානික ඉදිරිපත් කිරීමේ පද්ධතිය බලාත්මකභාවයට එළඹෙන තෙක් වත්කම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශ අතින් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දී ඇත.

02. ඒ අනුව කොමිෂන් සභාවේ උපදෙස් පරිදි 2025 වර්ෂයට අදාළව කොමිෂන් සභා වෙබ් අඩවියේ පළ කර ඇති ඩිජිටල් ආකෘතිය සම්පූර්ණ කර, ලබාදී ඇති උපදෙස් අනුගමනය කරමින් ප්‍රකාශකයන් විසින් සිය ප්‍රකාශ ඉදිරිපත් කල යුතුය.

03. මෙම පනතේ 90 වගන්ති ප්‍රකාරව, වත්කම් සහ බැරකම් ප්‍රකාශයට අදාළ වැරදි සහ ඒ සම්බන්ධයෙන් ගනුලබන නෛතික ක්‍රියාමාර්ග දක්වා ඇත. ඒ සම්බන්ධයෙන් ඔබගේ ආයතන නිලධාරීන් දැනුවත් කරන මෙන් දන්වමි.

04. **ඒ අනුව ප්‍රකාශකයන් විසින් නියමිත දිනට, නියමිත ආකෘති ප්‍රකාරව සිය වත්කම් සහ බැරකම් ප්‍රකාශය ඉදිරිපත් කල යුතු අතර එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන තැනැත්තන්ගේ නාම ලේඛනයක් අදාළ දිනට පසු දිනම, ආයතන ප්‍රධානීන් විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කල යුතුය. (2025.06.30 දිනට වාර්ෂික වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබා දුන් හා නොදුන් නිලධාරින්ගේ නම් ඇතුළත් <u>නාම ලේඛනය 2025.07.01 දින පස්වරු 01ට පෙර</u> කොමිෂන් සභාවේ වත්කම් සහ බැරකම් ප්‍රකාශ අංශය වෙත පැමිණ හෝ විද්‍යුත් තැපැල මගින් හෝ ෆැක්ස් මගින් ලබා දීමට ආයතන ප්‍රධානියා විසින් කටයුතු කළ යුතුය.)**

05. ඉහත තොරතුරු වලට අමතරව, මෙම වර්ෂයට අදාළ **වත්කම් සහ බැරකම් ප්‍රකාශ,** ලබා දී ඇති උපදෙස් අනුගමනය කරමින් සුරක්ෂිතව **2025.07.07** දින හෝ ඊට ප්‍රථම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ **වත්කම් සහ බැරකම් ප්‍රකාශ අංශයට** පැමිණ හෝ කුරියර් මගින් හෝ ලියාපදිංචි තැපැල ක්‍රමයට හෝ **එවීමට ආයතන ප්‍රධානියා විසින් කටයුතු කළ යුතුය.**

06. මෙයට අදාළ නෛතික ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සංක්ෂිප්ත හැඳින්වීමක් ඔබගේ දැනුවත් වීම සඳහා ඇමුණුම 1 මගින් දක්වා ඇත.

07. මේ සම්බන්ධයෙන් ඔබගේ නිලධාරීන් දැනුවත් කර අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් දන්වා සිටිමි.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

ආර්.එස්.ඒ දිසානායක
අධ්‍යක්ෂ ජනරාල්

ඇමුණුම 1

1. 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 90 වගන්තිය ප්‍රකාරව අදාල වත්කම් සහ බැරකම් ප්‍රකාශ, 82 වගන්ති ප්‍රකාරව නියමිත දිනට ඉදිරිපත් කිරීමට අපොහොසත් වන තැනැත්තන් සඳහා පහත පරිදි නෛතික ක්‍රියාමාර්ග ගැනීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මේ වන විට කටයුතු සිදුකරමින් පවතී.

   82 (1) අ - පළමු පත්වීම් ප්‍රකාශය -
   පත් කල දින සිට මාස 3ක් තුළ

   ආ- වාර්ෂික ප්‍රකාශය -
   අදාල වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පැවති වත්කම්,එම වර්ෂයේ ජුනි මස 30 වන දින වන විට

   ඇ- ධූර කාලය අවසානයේ දී හෝ විශ්‍රාම යාමේ දී සිදුකරනු ලබන ප්‍රකාශය -
   රජයේ සේවය හැර ගොස් දින 14 ක් ඇතුළත

   ඇ- පශ්චාත් විශ්‍රාම ප්‍රකාශය -
   ධූර කාලය අවසන් වීමෙන් පසු අනුගාමී වසර දෙකක් තුළ

   ඉ- තත්කාර්ය ප්‍රකාශය -
   රුපියල් මිලියන 10ක් හෝ 10ට වඩා වැඩි වත්කම් සහ බැරකම් පිලිබඳ වටිනාකමේ **සුවිශේෂී වෙනස්කමක්** සිදුවන අවස්ථාවක, ඒ දින සිට මාසයක් ඇතුළත

   ඊ- මැතිවරණ ප්‍රකාශය -
   නාම යෝජනා පත්‍රය ඉදිරිපත් කිරීමේදී

2. මෙසේ නියමිත පරිදි අදාළ වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන තැනැත්තන්, එකී පනතේ දෙවන කොටසට අදාළව වරදක් සිදුකරන අතර එහිදී දඩ මුදල් සහ නඩු විභාගයකින් පසු බන්ධනාගාරගත කිරීම් සම්බන්ධයෙන් පනතේ 90 වගන්තිය ප්‍රකාරව සවිස්තරාත්මකව දක්වා ඇත.

3. මෙහිදී, යම් තැනැත්තකු විසින් තම පළමු පත්වීමේ ප්‍රකාශය, වාර්ෂික ප්‍රකාශය හා තත්කාර්ය ප්‍රකාශය නියමිත දිනට සහ නියමිත ආකෘතිය ප්‍රකාරව ඉදිරිපත් කල යුතු අතර එසේ අපොහොසත් වන තැනැත්තකුගෙන් එම දඩ මුදල, පරිශ්‍රමිකයේ අධිභාරයක් ලෙස අය කරගත යුතු බව දක්වා ඇති අතර ධූරකාලය අවසානයේ දී හෝ විශ්‍රාම යෑමේදී සිදුකරනු ලබන ප්‍රකාශ නියමිත පරිදි ලබාදීමට අපොහාසත් වන තැනැත්තකුගෙන් එම දඩ මුදල, විශ්‍රාම ප්‍රතිලාභයේ අධිභාරයක් ලෙස අය කර ගත යුතු බව දක්වා ඇත.

4. මීට අමතරව එවැනි තැනැත්තන්හට පනතේ 90(4),(5),(6),(7),(8),(9) යන වගන්ති ප්‍රකාරව අධිකරණමය කටයුතු ක්‍රියාත්මක කිරීමටත්, පනතේ 90(10) සහ (11) වගන්ති ප්‍රකාරව අදාළ වත්කම් සම්බන්ධයෙන් එම තැනැත්තා වරදකරු කිරීමට ප්‍රකාරව සියලු බැඳීම් වලින් නිදහස්කොට රජය සතු කිරීමට ප්‍රතිපාදන සලසා ඇති බවත් තවදුරටත් සඳහන් කරමි.